පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA


තැ. පෙ. අංකය / த. பெ .இல. / P. O. Box No. — 517

ෆැක්ස් / தொலைநகல் / Fax No. — 011- 2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

Website: www.police.lk

ඊ - මේල් / மின்-அஞ்சல் / E-Mail — Policemedia@police.lk


මගේ අංකය / எனது இல. / My No. — PMD/PR/ 279 /20

ඔබේ අංකය / உமது இல. / Your No. —

දිනය / திகதி / Date — 2020.07.03 පැය 1620

**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / කර්තෘ,**
**මහත්මයාණනි / මහත්මියණි,**

## 2011 ලෝක කුසලාන අවසාන මහා තරඟය මුදලට පාවාදීම සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශනය සම්බන්ධව.

හිටපු ක්‍රීඩා අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් 2011 ලෝක කුසලාන අවසාන මහා තරඟය පාවා දුන් බවට කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් 2019 අංක 24 දරණ ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ පනත යටතේ ක්‍රීඩා වලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ විශේෂ විමර්ශන ඒකකය මඟින් විමර්ශනයක් ආරම්භ කරන ලදී.

මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් 2020.06.24 වන දින හිටපු අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතාගේ ප්‍රකාශයක් සටහන් කර ගෙන ඇත. ඉන් අනතුරුව එවකට තේරීම් කමිටුවේ සභාපති ලෙස ක්‍රියා කල අරවින්ද ද සිල්වා මහතා, ලෝක කුසලාන කණ්ඩායම නියෝජනය කල උපුල් තරංග මහතා හා කණ්ඩායම් නායක ලෙස ක්‍රියා කල කුමාර සංගක්කාර මහතා, ක්‍රීඩා වලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ විශේෂ විමර්ශන ඒකකය වෙත කැඳවා ප්‍රකාශ සටහන් කිරීමට කටයුතු කර ඇත.

ඊට අමතරව ලේඛණ ගණනාවක් පරීක්ෂා කර, සාක්ෂි හා පරීක්ෂණ අනුව 2011 ලෝක කුසලාන අවසන් මහ තරඟය පාවා දීමක් පිළිබඳව කරුණු අනාවරණය වී නොමැත. ඒ අනුව ක්‍රීඩා විමර්ශන ඒකකය විසින් විමර්ශන අවසන් කිරීමට තීරණය කර ඒ සම්බන්ධයෙන් අද දින වැඩ බලන පොලිස්පතිතුමා වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය,**
**පොලිස් මූලස්ථානය,**
**කොළඹ 01.**
(nimk)